# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,925/4 — 1970 සැප්තැම්බර් 30 වැනි බදාදා — 1970.9.30**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී. 49/50

### ඉඩම් අත්කර ගැනීමේ පනත

**49 අ (1) වැනි වගන්තිය යටතේ වූ ආඥාවයි**

1964 අංක 28 දරන පනතින් සංශෝධිත (460 වැනි අධිකාරය වන) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 49 අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩබලන මුදල් ඇමති බර්නාඩ් සොයිසා වන මම, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ඉඩම (399 වැනි අධිකාරය වන) ලංකා සේවිංස් බැංකු ආඥා පනතින් සංස්ථාපිත රජයේ නීතිගත සංස්ථාවක් වන ලංකා සේවිංස් බැංකුව පිහිටුවීම පිණිස අවශ්‍ය වී ඇති බැව් මේ ආඥාවෙන් ප්‍රකාශ කරමි.

බර්නාඩ් සොයිසා,
වැඩබලන මුදල් ඇමති.

1970 සැප්තැම්බර් මස 25 දින දී,
කොළඹ.

### උපලේඛනය

ඊසානට දනට ලංකා සේවිංස් බැංකුවට අයිති ඉඩම ද, ගිණිකොණට ස්ටේපල්ස් වීදිය ද, වයඹට හා නිරිතදිගට 1964 දෙසැම්බර් 1 වැනි දින හා අංක 1253/1964 දරන පිඹුරු කඩදසියේ දක්වෙන දෙවෙනි බිම් කැබෙල්ල (කොටසක්) ද මායිම්ව ඇති, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභාවේ පරිපාලන සීමාව තුළ පිහිටියා වූ සීමාසහිත කොළඹ කොමර්ෂල් සමාගම භූමියෙහි පිහිටි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ශිල්පීනු විසින් සාදන ලද 1969 දෙසැම්බර් මස 12 වෙනි දින දරණ පිඹුරෙහි නිල් පාටින් ලකුණු කල පර්චස් 30ක් (පමණ) විශාලත්වය ඇති නොබෙදුනු මුළු බිම් කැබෙල්ල.

10—265

---

එල්. ඩී. — බී. 9/67

### 1967 අංක 13 දරණ සහල් ආධාර බදු පනත

**3 (1) වගන්තිය යටතේ නිවේදනය**

1967 අංක 13 දරණ සහල් ආධාර බදු පනතේ 3(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වැඩබලන මුදල් ඇමති බර්නාර්ඩ් සොයිසා වන මම (171 වැනි අධිකාරය වන) ආහාර පාලන පනත යටතේ පනවන ලද නියෝග යටතේ සතියක තම සහල් සලාකය වශයෙන් යම් තැනැත්තකුට හිමි, ඒ ඒ අවස්ථාව පරිදි සහල් ඇවොරොදුපොයිස් රාත්තල් හතරක හෝ වී ඇවොරොදුපොයිස් රාත්තල් අටක එක් එක් ඒකකයට සහල් ආධාර බද්ද රුපියල් එකයි ශත විසිපහ බැගින් 1970 ඔක්තෝබර් 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගණන් බැලිය යුතු යැයි මේ නිවේදනයෙන් නියම කරමි.

බර්නාඩ් සොයිසා,
වැඩබලන මුදල් ඇමති.

1970 සැප්තැම්බර් 28,
කොළඹ.

10—275


722/7——ජේ 17219—11,450 (70/9)

එල්.ඩී.—බී. 80/44.

## පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

පඩිපාලක සභා ආඥපනතේ (136 පරිච්ඡේදය) 20(2) (ඩී) යන වගන්තිය යටතේ ඇමතිවරයා විසින් වර්ෂ 1944 නොවැම්බර් 3 දින අංක 9,327, වර්ෂ 1946 අගෝස්තු 16 දින අංක 9,591, වර්ෂ 1947 මාර්තු 21 දින අංක 9,683, වර්ෂ 1948 දෙසැම්බර් 10 දින අංක 9,928, වර්ෂ 1949 අප්‍රේල් 1 දින අංක 9,963, වර්ෂ 1950 ජූනි 2 දින අංක 10,108, වර්ෂ 1953 ජූනි 25 දින අංක 10,541, වර්ෂ 1958 ඔක්තෝබර් මස 27 දින අංක 11,568, වර්ෂ 1961 ජූලි 7 දින අංක 12,508, වර්ෂ 1962 ජූනි 22 දින අංක 13,179, වර්ෂ 1963 පෙබරවාරි මස 22 දින අංක 13,529 සහ වර්ෂ 1966 මාර්තු මස 18 දින අංක 14,687 යන ගැසට් පත්‍රයන්හි පළ කරන ලද නිවේදන මාර්ගයෙන් නියම බලධරයා ලෙස පත්කරනු ලැබූ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂ තැන්පත් ලෙස්ලි බර්ට්‍රම් රාජකරුණා වන මම, මෙහි දක්වෙන උප ලේඛනයෙහි සඳහන් එක් එක් ව්‍යාපාරයෙහි නියුක්ත සේවකයින් කෙරෙහි වර්ෂ 1970 සැප්තැම්බර් මස තුළ අදාල කළ හැකි ජීවන වියදම් දර්ශනාංකය 138.7 වන බව මෙයින් ප්‍රකාශ කරමි.

ලෙස්ලි බර්ට්‍රම් රාජකරුණා,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.

1970 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ 7, තැ.පෙ. 563 දරණ,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දීය.

### උපලේඛනය

1. මුද්‍රණ ව්‍යාපාරය.
2. මෝටර් රථ ගමනා ගමන ව්‍යාපාරය.
3. ගිනිපෙට්ටි සෑදීමේ ව්‍යාපාරය.
4. සිනමා (චිත්‍රපටි) ව්‍යාපාරය.
5. නෞකාගාර, නැව්තොට හා වරාය ගමනාගමන ව්‍යාපාරය.
6. ගොඩනැගිලි ව්‍යාපාරය.
7. තේ වැවීමේ සහ සෑදීමේ ව්‍යාපාරය.
8. කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ සෑදීමේ ව්‍යාපාරය.
9. රබර් වැවීමේ සහ සෑදීමේ ව්‍යාපාරය.
10. පොල් වැවීමේ ව්‍යාපාරය.
11. පොල් සෑදීමේ ව්‍යාපාරය.
12. මිනිරන් ව්‍යාපාරය.
13. බේකරි ව්‍යාපාරය.
14. ගඩොල් හා උළු සෑදීමේ ව්‍යාපාරය.
15. ගුදිරි කොහු හා ඇටකෙඳි කොහු පිටරට යැවීමේ ව්‍යාපාරය.
16. අයිස් සහ සිසිල් බීම සෑදීමේ ව්‍යාපාරය.
17. ඇඳුම් සෑදීමේ ව්‍යාපාරය.

10-260/1

---

## තේ වැවීමේ හා සෑදීම, රබර් වැවීම හා සෑදීම, කොකෝවා, කරද මුංගු හා ගම්මිරිස් වැවීම හා සෑදීම, පොල් වැවීම, පොල් සෑදීම, මිනිරන්, මුද්‍රණ, මෝටර් රථ ගමනාගමන, ගිනිපෙට්ටි සෑදීම, චිත්‍රපට (සිනමා), නෞකාගාර නැව්තොට හා වරායයන්හි ගමනාගමනය, ගොඩනැගිලි, බේකරි, ගඩොල් හා උළු සෑදීම, ගුදිරි කොහු හා ඇටකෙඳි කොහු පිටරට යැවීම හා අයිස් හා සිසිල් බීම සෑදීමේ සහ ඇඳුම් සෑදීමේ යන කර්මාන්තවල නියුක්ත වැඩකරුවන්නට ගෙවිය යුතු විශේෂ දීමනා

ඉහත සඳහන් කර්මාන්ත සඳහා 1970 සැප්තැම්බර් මාසයේ ජීවන වියදම් අංකය 138.7 වන නිසා, ඒ ඒ අවස්ථාවේ හැටියට, 1970 ඔක්තෝබර් මාසය වෙනුවෙන් හෝ 1970 ඔක්තෝබර් මාසයේ සාමාන්‍ය වැඩ කරන දිනයන් වෙනුවෙන් හෝ ගෙවිය යුතු විශේෂ දීමනාව පහත දක්වෙන ආකාරයට බැව, (136 වැනි පරිච්ඡේදය වන) පඩිපාලක සභා ආඥපනතේ, 20(2) (ඇ) යන වගන්තිය යටතේ, මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. තේ වැවීම හා සෑදීම, රබර් වැවීම හා සෑදීම, කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීම හා සෑදීම යන කර්මාන්ත :—

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| වයස අවුරුදු 16 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට ... ... ... | 1 72 |
| වයස අවුරුදු 15 කට අඩු නැති ගැහැණු වැඩකාරියකට ... ... ... | 1 24 |
| ළමා වැඩකරුවකුට ... ... ... ... ... | 1 17 |

2. පොල් වැවීමේ කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| වයස අවුරුදු 16 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට (කංකානමද ඇතුළුව) ... ... | 1 72 |
| වයස අවුරුදු 15 කට අඩු නැති ගැහැණු වැඩකාරියකට ... ... ... | 1 24 |
| වයස අවුරුදු 16 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට හෝ වයස අවුරුදු 15 කට අඩු ගැහැණු වැඩකාරියකට ... ... ... ... ... | 1 17 |

3. පොල් සෑදීමේ කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| වයස අවුරුදු 18 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට (කංකානමද ඇතුළුව) ... ... | 2 57 |
| වයස අවුරුදු 18 කට අඩු නැති ගැහැණු වැඩකාරියකට ... ... ... | 2 04 |
| වයස අවුරුදු 18 කට අඩු (ස්ත්‍රී පුරුෂ භේදය නොසළකා) වැඩකරුවකුට ... ... | 1 97 |

**4. මිකිරත් කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| විකිණිය හැකි මිකිරත් ශුද්ධ කිරීම හා සකස් කිරීම පිළිබඳ වැඩවල යෙදී සිටින අය නොවන වැඩ කරුවෝ— | |
| වයස අවුරුදු 18 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට... ... ... ... | 1 81 |
| වයස අවුරුදු 18 කට අඩු නැති ගැහැණු වැඩකාරියකට ... ... ... | 1 30 |
| වයස අවුරුදු 18 කට අඩු (ස්ත්‍රී පුරුෂ භේදයක් නොසලකා) වැඩකරුවකුට ... ... | 1 23 |
| වයස අවුරුදු 18 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට ... ... ... | 2 01 |
| වයස අවුරුදු 18 කට අඩු නැති ගැහැණු වැඩකාරියකුට ... ... ... | 1 50 |
| වයස අවුරුදු 18 කට අඩු (ස්ත්‍රී පුරුෂ භේදයක් නොසලකා) වැඩකරුවකුට ... ... | 1 43 |

**5. මුද්‍රණ කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | මාසයට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| වැඩ ඉගෙන ගන්නන් හා වැඩ පුරුදු වන්නන් නොවන වැඩ කරුවෝ— | |
| "ඒ" පන්තිය ... ... ... ... ... | 138 42 |
| "බී" පන්තිය ... ... ... ... ... | 109 42 |
| "සී" පන්තිය I වන වර්ගය ... ... ... ... | 94 92 |
| "සී" පන්තිය II වන වර්ගය ... ... ... ... | 87 48 |
| "ඩී" පන්තිය ... ... ... ... ... | 80 42 |
| "ඊ" පන්තිය ... ... ... ... ... | 76 89 |
| "එෆ්" පන්තිය ... ... ... ... ... | 48 52 |
| "ජී" පන්තිය ... ... ... ... ... | 80 42 |

| | 1 වැනි අවුරුද්ද රු. ශ. | 2 වැනි අවුරුද්ද රු. ශ. | 3 වැනි අවුරුද්ද රු. ශ. | 4 වැනි අවුරුද්ද රු. ශ. | 5 වැනි අවුරුද්ද රු. ශ. |
|---|---|---|---|---|---|
| වැඩ ඉගෙන ගන්නෝ හා වැඩ පුරුදු වන්නෝ — | | | | | |
| "ඒ" පන්තිය... ... ... | 54 72 | 66 82 | 78 92 | 96 82 | 115 22 |
| "බී" පන්තිය... ... ... | 46 02 | 63 92 | 73 12 | 86 48 | — |
| "සී" පන්තිය I වන වර්ගය ... ... | 48 92 | 56 48 | 64 42 | 75 89 | — |
| "සී" පන්තිය II වන වර්ගය ... ... | 46 02 | 52 95 | 59 88 | 70 21 | — |
| "ඩී" පන්තිය... ... ... | 43 12 | 49 42 | 55 72 | 64 62 | — |

**6. මෝටර් රථ ගමනාගමන කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | විශේෂ දීමනාව: මාසයට රු. ශ. | විශේෂ දීමනාව: සාමාන්‍ය වැඩ කරන දිනයකට රු. ශ. |
|---|---|---|
| "ඒ", "බී", "ඩී" හා "එෆ්" යන පන්ති ... ... ... | 80 42 | 3 52 |
| "සී" පන්තිය ... ... ... ... | 77 92 | 3 52 |
| "ඊ" පන්තිය ... ... ... ... | 75 42 | 3 27 |
| "ජී" හා "එච්" පන්ති ... ... ... ... | 74 62 | 3 52 |
| "කේ" පන්තිය ... ... ... ... | 62 17 | 2 36 |
| "අයි" හා "ජේ" පන්ති ... ... ... ... | 74 62 | — |

**7. ගිනිපෙට්ටි සෑදීමේ කර්මාන්තය :**

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව: පුරුෂයින්ට රු. ශ. | ස්ත්‍රීන්ට රු. ශ. |
|---|---|---|
| ඒ. වැඩිහිටි අය (වයස අවුරුදු 18 සහ ඊට වැඩි)— | | |
| I වන හා II වන වර්ග ... ... ... ... | 2 36 | 2 26 |
| III වන වර්ගය ... ... ... ... | 2 26 | 2 14 |
| IV වන වර්ගය ... ... ... ... | 2 36 | — |

| බී. තරුණ අය— | ස්ත්‍රී පුරුෂ භේදයක් නොසලකා රු. ශ. |
|---|---|
| I වන හා II වන වර්ග—වයස අවුරුදු 14 ට වැඩිවූ සහ අවුරුදු 18 ට අඩුවූ විට ... | 1 76 |
| III වන වර්ගය—වයස අවුරුදු 16 සහ ඊට වැඩි එහෙත් අවුරුදු 18 ට අඩු වූ විට ... | 1 76 |
| වයස අවුරුදු 14 ට වැඩි එහෙත් අවුරුදු 16 ට අඩුවූ විට ... ... | 1 36 |

**8. චිත්‍රපට (සිනමා) කර්මාන්තය :**

| වැඩ කරුවාගේ පන්තිය | මාසයට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| ඒ. ලිපිකාර නොවූ— | |
| අදක්ෂ/නුපුහුණු වැඩකරුවෝ ... ... ... ... | 68 26 |
| අර්ධ වශයෙන් පුහුණු වැඩකරුවෝ ... ... ... | 70 86 |
| පුහුණු වැඩකරුවෝ, I වන සහ II වන වර්ග ... ... ... | 72 68 |
| බී. ලිපිකාර— | |
| III වන වර්ගය ... ... ... | 62 50 |
| II වන වර්ගය ... ... ... | 65 50 |
| I වන වර්ගය ... ... ... | 70 00 |

ජාතික පුස්තකාල හා

9. නෞකාගාර, නැව්තොට හා වරායයන්හි ගමනා ගමන කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | මාසයට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| බර වැඩ— | |
| විශේෂ වර්ගය ... ... ... ... | 48 25 |
| පුහුණු වර්ගය ... ... ... ... | 44 25 |
| අර්ධ වශයෙන් පුහුණු වර්ගය, අදක්ෂ/නුපුහුණු I වන හා II වන වර්ග සහ ගැහැණු වැඩකාරියෝ ... ... ... ... | 41 25 |
| බර වැඩ නොවන වැඩ— | |
| විශේෂ වර්ගය ... ... ... ... | 59 0 |
| I වන වර්ගය ... ... ... ... | 44 25 |

10. ගොඩනැගිලි කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| අදක්ෂ/නුපුහුණු කම්කරුවෝ ... ... ... ... | 2 63 |
| අර්ධ වශයෙන් පුහුණු II වන වර්ගය, අර්ධ වශයෙන් පුහුණු I වන වර්ගය හා පුහුණු වැඩකරුවෝ ... ... ... ... | 2 73 |

11. බේකරි කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | මාසයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| "ඒ" පන්තියේ වැඩකරුවෙකුට ... ... ... | 85 45 |
| "බී" පන්තියේ වැඩකරුවෙකුට ... ... ... | 77 50 |
| "සී" පන්තියේ වැඩකරුවෙකුට ... ... ... | 56 92 |

12. ගඩොල් හා උළු සෑදීමේ කර්මාන්තය :

| කම්කරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| "ඒ" වයස අවුරුදු 18 ට නොඅඩු පිරිමි කම්කරුවෝ— | |
| පුහුණු කම්කරුවෝ I හා II වනු වර්ගය හා අර්ධ වශයෙන් පුහුණු වූ කම්කරුවෝ | 2 51 |
| නුපුහුණු කම්කරුවෝ (අදක්ෂ) ... ... | 2 41 |
| "බී" වයස අවුරුදු 18 ට නොඅඩු ගැහැණු කම්කරුවෝ ... ... | 2 30 |
| "සී" වයස අවුරුදු 18 ට අඩු කම්කරුවෝ (ස්ත්‍රී/පුරුෂ භෙදයක් නොසලකා)— | |
| වයස අවුරුදු 14 ට වැඩි එහෙත් 15 ට අඩු ... ... ... | 1 76 |
| වයස අවුරුදු 15 ට වැඩි එහෙත් 16 ට අඩු ... ... ... | 1 81 |
| වයස අවුරුදු 16 ට වැඩි එහෙත් 17 ට අඩු ... ... ... | 1 86 |
| වයස අවුරුදු 17 ට වැඩි එහෙත් 18 ට අඩු ... ... ... | 1 96 |

13. ගුදිරි කොහු හා ඇටකෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය :

| කම්කරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනාව රු. ශ. |
|---|---|
| "සී" වයස අවුරුදු 18 ට අඩු (ස්ත්‍රී/පුරුෂ භෙදයක් නොමැතිව) කම්කරුවෝ— | |
| වයස අවුරුදු 14 ට වැඩි එහෙත් 15 ට අඩු ... ... | 1 93 |
| වයස අවුරුදු 15 ට වැඩි එහෙත් 16 ට අඩු ... ... | 1 98 |
| වයස අවුරුදු 16 ට වැඩි එහෙත් 17 ට අඩු ... ... | 2 03 |
| වයස අවුරුදු 17 ට වැඩි එහෙත් 18 ට අඩු ... ... | 2 13 |

14. අයිස් හා සිසිල් බීම සෑදීමේ කර්මාන්තය :

| කම්කරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනා රු. ශ. |
|---|---|
| I වැනි හා II වැනි ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... | 2 73 |
| III වැනි ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... ... | 2 63 |

15. ඇඳුම් සෑදීමේ කර්මාන්තය :

| කම්කරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩකරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනා රු. ශ. |
|---|---|
| I (අ) ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... ... ... | 3 52 |
| I (ආ) ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... ... ... | 3 52 |
| II වන ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... ... ... | 2 73 |
| III වන ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... ... ... | 2 63 |
| IV වන ශ්‍රෙණියේ කම්කරුවෝ ... ... ... ... | 2 41 |
| V වන ශ්‍රෙණියේ කම්කරුවෝ (ආධුනිකයන් පුහුණුවන්නන්) ... ... | 2 05 |

ඇම්. මතියාපරනම්,
වැඩ බලන කම්කරු කොමසාරිස්.

වර්ෂ 1970 සැප්තැම්බර් මස 30 දින,
කොළඹ දීය.

10-260/2

## අවුම වැටුප් (ඉන්දියානු කම්කරු) ආඥපනතේ විධිවිධාන (133 වන පරිච්ඡෙදය) යටතේ සැලකෙන්නා වූත් කම්කරු පඩි සභා තීරණ අදල නොවන්නා වූත් කම්කරුවනට ගෙවිය යුතු ජීවනාධාර මුදල

අවුම වැටුප් (ඉන්දියානු කම්කරු) ආඥපනතේ විධිවිධාන යටතේ සැලකෙන්නා වූත්, කම්කරු පඩි සභා ආඥ පනත යටතේ නියමිත අවුම වැටුප් ගෙවිය යුතු නොවන්නාවූත් කම්කරුවකුට 1970 සැප්තැම්බර් මාසයේ වැඩ කරන එක් එක් දවසකට ගෙවිය යුතු ජීවනාධාර මුදල සියලු දෙනාගේම දන ගැනීම පිණිස මෙහි පහත පළ කරනු ලබේ :—

| | උඩරට<br>රු. ශ. | මැදිරට<br>රු. ශ. | පහතරට<br>රු. ශ. |
|---|---|---|---|
| පිරිමි කම්කරුවකුට ... ... ... | 1 20 ... | 1 16 ... | 1 12 |
| කම්කරු ස්ත්‍රියකට ... ... ... | 0 96 ... | 0 93 ... | 0 89 |
| ළමා කම්කරුවකුට ... ... ... | 0 96 ... | 0 93 ... | 0 89 |

වත්තක් උඩරට, මැදිරට හෝ පහත රට යනුවෙන් සැලකෙන්නේ වර්ෂ 1940 දෙසැම්බර් මස 23 වන දින දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1940 දෙසැම්බර් මස 21 වන දින අංක 281 දරන නිවේදනයේ පෙන්නා ඇති පරිද්දෙනි.

ඇම්. මතියාපරනම්,
වැඩබලන කම්කරු කොමසාරිස්.

වර්ෂ 1970 සැප්තැම්බර් මස 29 දින,
කොළඹදිය.

10–260/3

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.